# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 32 දරන සාලිහියා තයික්කා (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 1998 ජූනි මස 10 වන දින.]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජූනි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 6.75 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

## 1998 අංක 32 දරන සාලිහියා තයික්කා (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1998 ජූනි මස 10 වන දින]

**එල්. ඩී.–ඕ. 58/93.**

**සාලිහියා තයික්කා සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

කායල්පට්ටිනම්හි ශුද්ධෝත්තම කුතුබුස්සමාන් ෂේක්–උල් ආරිෆීන් මුහමඩ් සාලිහු වලියුල්ලාගේ කලීෆා වූ ශුද්ධෝත්තම මර්හුම් ෂේක්උල් වුජුඩ් හාජි වල් ආරිෆ් ෂේක් අබ්දුල් සානි ෂාහිබුල් ක්වාදිරිවර්–රිෆායි (රලියල්ලාහු–අන්හු) විසින් ක්වාදිරියා තුස් සාලිහියා තරීකත්හි කටයුතු ප්‍රවර්ධනය කිරීම පිණිස ඉස්ලාමීය හිජ්රි වර්ෂ 1346 ට අනුරූප වර්ෂය වන 1925 වර්ෂයේ දී කොළඹ 12, අලුත් යොන්වීදියේ අංක 132 දරන ස්ථානයෙහි "සාලිහියා තයික්කා" ආරම්භ කරනු ලැබ ඉන් අනතුරුව 1985 ඔක්තෝබර් මස 16 වන දින අල්-මද්රසතුස් සාලිහියා යන නාමය සහ අභිධානය යටතේ ඉස්ලාමීය අධ්‍යාපන ආයතනයක් ඉහතකී 'සාලිහියා තයික්කා' හි ආරම්භ කරනු ලැබූ හෙයින් ද ; පූර්විකාව.

එකී 'සාලිහියා තයික්කා' පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ මෙතෙක් කල් එකී සාලිහියා තයික්කා විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ගෙන ගොස් ඇති හෙයින් ද ;

එකී 'සාලිහියා තයික්කා' හි පාලක මණ්ඩලය විසින් එකී සාලිහියා තයික්කා සංවිධානය සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලීමක් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 32 දරන සාලිහියා තයික්කා (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු 'තයික්කා' යනුවෙන් සඳහන් කරනු ලබන කොළඹ 'සාලිහියා තයික්කා' හි පාලක මණ්ඩලයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු 'සංස්ථාව' යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව 'සාලිහියා තයික්කා' යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. කොළඹ සාලිහියා තයික්කා සංස්ථාගත කිරීම.

2—D 034641—5,900 (94/12)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) අරාබි භාෂාව හා සාහිත්‍යය, ඉස්ලාම් ධර්මය, ඉතිහාසය සහ සංස්කෘතිය, ඒවායේ සියලු අංශවලින් අධ්‍යයනය කිරීම ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම සහ එකී විෂයයන් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම :

(ආ) ඉස්ලාමීය සංස්කෘතික හා සමාජ කටයුතු පිළිබඳ කේන්ද්‍ර ස්ථානයක් වශයෙන් තයික්කාව ගොඩනැගීම, පුනස්ථානයට පත් කිරීම, නඩත්තු කිරීම සහ පවත්වා ගෙන යාම:

(ඇ) තයික්කාවට අනුබද්ධ සිද්ධස්ථානය පුනස්ථානයට පත් කිරීම, සහ පවත්වා ගෙන යාම :

(ඈ) මෞල වී සහ ආණ්ඩුව විසින් පිළිගනු ලැබූ වෙනත් උසස් විභාගවලට පෙනී සිටීමට ශිෂ්‍යයන් සූදානම් කරනු පිණිස 'සාලිහියා තයික්කා' වේ නාමය යටතේ අරාබි භාෂාව සහ ඉස්ලාම් ධර්මය පිළිබඳ පන්ති පැවැත්වීම :

(ඉ) මුස්ලිම් ජනතාව සඳහා අධ්‍යාපන පහසුකම් සැලසීම :

(ඊ) වෙනත් සමාජ, අධ්‍යාපන සහ ආගමික කටයුතු ප්‍රවර්ධනය කිරීම :

(උ) ඉහත කී පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශාඛා විවෘත කිරීම :

(ඌ) ඉස්ලාම් ධර්මය පිළිබඳ පොත්, වාර සඟරා, සඟරා සහ පත්‍රිකා මුද්‍රණය කිරීම, ප්‍රකාශ කිරීම සහ බෙදා හැරීම :

(එ) මුස්ලිම් ජනයා අතර ඉස්ලාම් ධර්මය ප්‍රායෝගික වශයෙන් පිළිපැදීමට දිරි ගැන්වීම :

(ඒ) කියවීම් ශාලා හා පුස්තකාල පිහිටුවීම, පොත්පත්වලින් සජ්ජිත කිරීම සහ පවත්වා ගෙන යාම, ඉස්ලාම් ධර්මය අධ්‍යයනය කිරීම සහ ප්‍රචාරය කිරීම සඳහා දිරි ගැන්වීම :

(ඔ) සාලිහියා රාතිබ් හා zසික්ර් මජ්ලිස් සංවිධානය කිරීම සහ පැවැත්වීම සහ ක්වාදිරියාතුස් සාලිහියා තරිකත් හි කටයුතු වැඩිදියුණු කිරීම :

(ඕ) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීමට ආනුෂංගික හෝ හිතකර වූ ද මේ පනතට හෝ යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන්නා වූ ද වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් පරමාර්ථ ඉස්ලාමීය ෂරියාත් සංග්‍රහයේ සුන්නත්වල් ජමාත්වලට සැමවිටම අනුකූල විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ; සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය හෝ අවස්ථානුකූල වූ සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීමේ සහ ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදීමේ බලය, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමණාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයන් දහහත් දෙනකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් විසින් මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව, පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි තයික්කාවේ කළමනාකාර මණ්ඩලයේ ධූර දැරුවා වූ සහ මේ පනතේ උපලේඛනයෙහි නම් දක්වා ඇත්තා වූ තයික්කාවේ භාරකරුවන්ගෙන් සංස්ථාවේ පළමුවන භාරකාර මණ්ඩලය සමන්විත විය යුතු ය.

(3) භාරකාර මණ්ඩලයේ සාමාජිකයකුගේ මරණය සිදුවුවහොත් භාරකාර මණ්ඩලය විසින් ඉතිරි භාරකරුවන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් ඒ පුරප්පාඩුව පිරවිය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) භාරකාර මණ්ඩලය තෝරා පත් කර ගැනීම සඳහා ද භාරකාර මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු කිරීමේ ද අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සම්බන්ධයෙන් ද මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, කලින් කල, යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණි ඡන්දය දෙන

සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් සංස්ථාව විසින් සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එසේ සාදන ලද රීති, එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි බලාත්මක වූ තයික්කාවේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් නීතියක හෝ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සියලු සාමාජිකයෝ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුත්තා හ.

තයික්කාව විසින් ගෙවිය යුතු සහ තයික්කාවට අයවිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී තයික්කාවේ පැවති සියලු ම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපිත සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට තයික්කාවට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හෝ සාමාජික මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල නිශ්චය දේපළ දැරිය හැකි සහ නියාදනය කළ හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මගින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත සතු කරනු ලබන යම් චංචල සහ නිශ්චල දේපළක් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව භාර ගැනීමට සහ අත්කර ගැනීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එකී සියලු දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තවද, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද සංස්ථාව සතු වන්නේ ය.

සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු බව.

9. කවර ප්‍රභවයකින් උද්ගත වුවද සංස්ථාවේ මුදල් සහ දේපළ හුදෙක්ම මෙහි සඳහන් කර ඇති සංස්ථාවේ පරමාර්ථ නංවාලීම උදෙසා පමණක් ම යොදා ගත යුතු අතර ඉන් කිසිම කොටසක්, සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ණය, ප්‍රසාද මුදල් හෝ වෙනත් කවර වුවද ආකාරයක ලාභ වශයෙන් කෙලින් ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය :

එසේ වුවද මේ වගන්තියේ විධිවිධාන මගින්,

(අ) සංස්ථාවේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් සංස්ථාවට කරන ලද යම් සේවාවන් වෙනුවෙන්, සද්භාවයෙන් යම් සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයක් ඔහුට ගෙවීම :

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු යම් කොටස්කරුවකු වන සමාගමක් විසින්, සංස්ථාවට කුලියට දෙන ලද ස්ථානයක් සඳහා සාධාරණ සහ නිසි කුලියක් ගෙවීම ; සහ

(ඇ) තම කර්තව්‍ය හෝ කාර්ය ඉටුකිරීමෙහි ලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමෙහි ලා සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින්, භාරකාර මණ්ඩලයෙන් කලින් ලබා ගන්නා ලද අනුමතය ඇතිව, දරන ලද යුක්ති සහගත හා නිසි වියදම් ආපසු ගෙවීම

වළක්වනු නොලැබිය යුතු ය.

දේපළ අත්කර ගැනීම, අරමුදල් ආයෝජනය කිරීම, ණය ලබාගැනීම ආදිය සඳහා සංස්ථාවේ බලතල.

10. සංස්ථාව විසින් පහත දැක්වෙන කටයුතු කිරීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා නීත්‍යානුකූල ලෙස අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීම සහ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමේ අරමුණ ඇතිව අවස්ථානුකූල යයි පෙනී යන විට ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ ඒවා නියාදනය කිරීම ;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් මුදල් භාරකාර මණ්ඩලයට සුදුසු යයි හැඟෙන යම් ආකාරයකින් ආයෝජනය කිරීම සහ එකී ආයෝජන කලින් කල වෙනස් කිරීම සහ මාරු කිරීම ;

(ඇ) සංස්ථාවේ යම් කාර්යයක් සඳහා මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම සහ සංස්ථාවේ යම් ණයක් හෝ බැඳීමක් සුදුසු යයි අදහස් කරන ආකාරයකට නිදහස් කිරීම ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා දායක මුදල්, ප්‍රදාන සහ පරිත්‍යාග සහ සියලු වර්ගයේ තෑගි මෙරටින් හෝ විදේශයන්ගෙන් ඉල්ලා සිටීම, ලබා ගැනීම සහ භාර ගැනීම;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම, වෙනස් කිරීම සහ නඩත්තු කිරීම ;

(ඊ) යම් පුණ්‍ය කර්මයක් සඳහා මුදලින් දායකවීම හෝ මුදල් ප්‍රදානය කිරීම ;

(ඇ) යම් නිශ්චල හෝ පෞද්ගලික දේපළවලට බලපාන යම් නීත්‍යානුකූල නීති සහ කොන්දේසි භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම :

(ඈ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම පිණිස සංස්ථාව විසින් ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන විවිධ ක්‍රියාකාරකම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා විවිධ ශාඛා හා ආයතන පිහිටුවීම, සංවිධානය කිරීම සහ පවත්වාගෙන යාම :

(එ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙන් පහකිරීම හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් කලින් කල තීරණය කරනු ලබන වැටුප්, විශ්‍රාම වැටුප්, පාරිතෝෂික සහ දීමනා ඔවුන්ට ගෙවීම :

(ඒ) සංස්ථාවේ කලින් සිටි හෝ දැනට සිටින සේවකයන්ට හෝ ඔවුන්ගේ ඥාතීන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට පාරිතෝෂික, විශ්‍රාම වැටුප්, දීමනා හෝ වෙනත් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම පිණිස යම් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවීම හෝ එවැනි අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක වීම :

(ඔ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා, සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද යම් තැනැත්තකු, සමාගමක්, සමිතියක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් පාලන ආයතනයක් සමග යම් ගිවිසුමකට එළඹීම.

සංස්ථාවේ මුද්‍රාව.

11. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමා පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම තම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට බාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

12. සංස්ථාවේ කිසිම සාමාජිකයකු, සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයකට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයත් විය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

**13.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයකට හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය. ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**උපලේඛනය** [5(2) වන වගන්තිය]

1. ජනාබ් කුණ්ඩු අබ්දුල් කාදර් අබ්දුල් වහාබ්
2. මර්හුම් අබ්දුල් මජීඩ් මොහමඩ් සිදීක්
3. ජනාබ් අබ්දුල් කාදර් මොහොමඩ් අලි
4. ජනාබ් හමීඩ් ෂෙයින්උල් ආබ්ඩීන්
5. ජනාබ් ඔමර් සුරෙයික් කාමිල්
6. ජනාබ් කවුzසුල් හමීඩ් එස්.
7. ජනාබ් මීරා සාහිබ් ෂිබ්ලි ෂාහුල් හමීඩ්
8. ජනාබ් සම්සුඩීන් තජ්මුඩීන්
9. ජනාබ් මීරා සාහිබ් මොහිඩීන් අබ්දුල් කාදර්
10. ජනාබ් මොහොමඩ් හනීෆා මොහොමඩ් මොහිනුඩීන්
11. ජනාබ් මුස්තාෆා මොහමඩ් zසුබෙයිරුත්
12. ජනාබ් අබ්දුල් හමීඩ් මොහමඩ් මොහිඩීන්
13. ජනාබ් මොහොමඩ් මලික් සිදීක්
14. ජනාබ් අහමඩ් කබීර් මොහමඩ් අලි
15. ජනාබ් මීරා සාහිබ් zසුල්ෆිකාර් මොහමඩ්
16. ජනාබ් අබ්දුල් හසන් මොහමඩ් ෆzස්ලි
17. ජනාබ් අබ්දුල් රzසාක් මොහමඩ් ජිෆ්රුල් රzසාක්

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.